Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# පුබුදින පස් පියුම් - 2024

## 5) ශ්‍රේණිය - ශිෂ්‍ය සාධනය ඉහළ නැංවීමේ වැඩ සටහන

## මහනුවර අධ්‍යාපන කලාපය

නම :- ............................................ කාලය : පැය (1) යි

**විභාගයට පෙනී සිටින ඔබට උපදෙස්**

විභාග අංකය: ........................................

- ඔබේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න (40) ක් ඇත. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයන්න.
- පිළිතුරු තුනක් දී ඇති ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.)


| පිටු අංකය | ලැබූ කුණු |
|---|---|
| 02 | |
| 03 | |
| 04 | |
| 05 | |
| 06 | |
| 07 | |
| 08 | |
| එකතුව | |
| අවසාන ලකුණ | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | කෙටි අත්සන හා සංඛේත අංකය |
|---|---|
| **පළමු පරීක්ෂක**<br>ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍ර ඇගයීම් කළ බව සහතික කරමි. | V/I/S |
| **දෙවන පරීක්ෂක**<br>පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි. | V/I/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක**<br>ඇගයීම් කර, ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණු නිවැරදි බව තහවුරු කරමි. | V/I/S/EMF |
| **ප්‍රධාන පරීක්ෂක**<br>අධීක්ෂණය කළෙමි අවසාන ලකුණු නිවැරදිය. | V/I/S/EMF |

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com


❖ පහත දී ඇති රූපවලින් එක් රූපයක් අනික් රූප දෙකටවඩා වෙනස් ය. එම වෙනස් රූපය තෝරන්න.

1.



1) 2) 3)


2.



1) 2) 3)


❖ අංක 3 හා 4 වල ප්‍රශ්නවල මුලින් දී ඇති රූපය සම්පූර්ණ කිරීමට ගැලපෙන කොටස තෝරන්න.

3.




1) 2) 3)

4.



1) 2) 3)

05. මුලින් දී ඇති රූප දෙක එක මත එක තැබු විට ලැබෙන රූපය තෝරන්න.



1) 2) 3)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

❖ පහත දී ඇති යෙදුමට ගැළපෙන කියමන තෝරන්න.


06. 'හීන් දාඩිය දැම්මා' යනුවෙන් අදහස් කරන්නේ

1) අධික දහඩිය පිට වු බවයි  2) අධික බියට පත් වු බවයි

3) දහඩිය හීනියට දැමු බවයි


පහත රටාව තේරුම්ගෙන හිස්තැනට ගැළපෙන සංඛ්‍යාව තෝරා යටින් ඉරක් අඳින්න.

7.




1) 12  2) 15  3) 18

8.




1) 54  2) 45  3) 16

❖ ඉලක්කම් වෙනුවට සංඛේත යොදා ඇති සම්බන්ධතාවක් රූපයේ දැක්වේ. මෙම සෑම සංඛේතයකටම ද 10 ට අඩු අගයක් ලබා දී ඇත.

△ + △ = □  □ - ○ = ⬡  ○ + ○ = △

09. මෙම සංකේත ආරෝහණ ක්‍රමයට සකස් කළ විට ලැබෙන පිළිතුර තෝරන්න.


1) △ ○ □ ⬡  2) □ ○ △ ⬡  3) ○ △ ⬡ □

10. නිවැරදි සම්බන්ධතාවය තෝරන්න.

1) ⬡ - ○ = △ + ⬡  2) □ - ○ = ⬡ + △  3) ⬡ - ○ = ○ + ○

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

11.




දිග හරින ලද ඝනකයක පතරොමක් දී ඇත. එහි මුහුණත්වල සංඛ්‍යා සටහන් කර තිබේ. මෙය ඝනකයක් ලෙස සකස් කළ විට එහි මුහුණත්වල ඇති සංඛ්‍යා අතර සම්බන්ධතාවක් හඳුනා ගත හැකි වේ. එම සම්බන්ධතාව අනුව හිස්තැනට සුදුසු සංඛ්‍යාව තෝරන්න.

1) 5 2) 7 3) 1

12. එකම ඉලක්කම එක් වතාවකට වඩා තිබෙන සේ කාඩ්පත් 10 ක එක් ඉලක්කම බැගින් ලියා ඇත. කාඩ්පත් 5 ක ඇති ඉලක්කම්වල එකතුව 10 කි. ඉතුරු කාඩ්පත් 5 හි ඇති ඉලක්කම්වල එකතුවට තිබිය හැකි වැඩි ම අගය.

1) 20 2) 15 3) 45

13. සදුනිගේ අම්මාට දියණිවරු තිදෙනෙක් ද පුතුන් දෙදෙනෙක් ද සිටිති. සදුනිට සිටින සහෝදරියන් ගණන කීය ද?

1) 3 2) 4 3) 2

14. අමරපාලගේ කුඹුරේ ගොයම් කැපීමට කාන්තාවන් දෙදෙනෙක් යෙදවුව හොත් දින 5 ක් ගත වේ. ඔහුට දින දෙකකින් ගොයම් කපා ගැනීමට නම් කාන්තාවන් කී දෙනෙක් යෙදවිය යුතු වේ ද?

1) 10 2) 5 3) 7

15. එක්තරා මිනිසෙක් කොටියෙක්, එළුවෙක් සහ තම්පලා මිටියක් රැගෙන ගංගාවකින් එතෙර වීමට යයි. ගඟේ ඇති ඔරුවේ වරකට ගෙන යා හැකි වන්නේ මිනිසා සමග ඔහු රැගෙන යන එක් දෙයක් පමණි. ඒ අනුව ඔහුට මුලින්ම ගෙනයාමට වඩාත් සුදුසු දෙය වන්නේ කුමක් ද?

1) කොටියා ය. (2) එළුවා ය. 3) තම්පලා මිටි ය.

16. එකළඟ පිහිටි සංඛ්‍යා 3 ක එකතුව 96 කි. එහි පළමු හා තුන්වන සංඛ්‍යා දෙකෙහි එකතුව කියද?

1) 64 2) 66 3) 63

17. සිරිල් ඉතා උසස් ලෙස විභාගය සමත් වුයේ ය. එයට හේතුව විය හැක්කේ,

1) සිරිල්ගේ වාසනාව නිසා.

2) සිරිල් හොඳින් මහන්සි වී පාඩම් වැඩ කළ නිසා.

3) සිරිල් දිනපතා පාසල් පැමිණ නිසා.


18. පහත දී ඇති සංවාදය කියවා නිවැරදි අනුපිළිවෙළ සහිත පිළිතුර තෝරන්න.


A. ඉස්කෝලේ යන්නේ කොහොම ද? තෙමෙන්නයි වෙන්නේ,
B. අදිත් වහිවී ද? අහස නම් කළු කරලා.
C. අමතක නොකර කුඩය අරන් යන්න.
D. ඊයේ දවස ම වැස්සා.

1) A, D, C, B 2) C,B,A,D 3) B,D,A,C


Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

19. පහත කොටුව තුළ ඇති සියලු ම දේ භාවිතා කර සෑදිය හැකි රූපය තෝරන්න.






1)



2)




3)

20. P, T, S හා A සිසුන් සිවු දෙනෙකි P සහ S ගණිතයට දක්ෂය. T සහ S ඉංග්‍රීසි භාෂාවට දක්ෂය, A,T,S, සංගීතයට දක්ෂය. P හා T විද්‍යාවට දක්ෂය, මේ අයගෙන් විෂයන් තුනකට දක්ෂ සිසුවා වන්නේ,

1) P හා S 2) T හා S 3) S හා A

21. ගස්වල පිපෙන මල්, වැල්වල පිපෙන මල් සමන්පිච්ච මල් හා මල් අතර ස්ම්බන්ධතාවය පහත රූපයෙන් නිරූපණය කෙරේ.





1) D 2) P 3) S

22. තාත්තා උදෑසන වැඩට යන විට ගමනින් 1/4 ක් බයිසිකලයෙන්ද 1/2 ක් දුම්රියෙන්ද ගොස් ඉතිරි දුර පයින් ද ගමන් කරයි. පයින් ගමන් කරන දුර 12 Km ක් නම් ගමනේ මුළු දුර කොපමණද?

1) 12 Km 2) 48 Km 3) 24 Km

23.



රූපයේ පාටකර ඇති කොටු ගණන

1) $^{1}/4$ කට වැඩි ය.

2) $^{1}/4$ කි.


3) $^{1}/4$ කට වඩා අඩු ය.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

24. 2021 වර්ෂයේ ජනවාරි මාසයේ සිකුරාදා, සෙනසුරාදා, ඉරිදා දින පහක් බැගින් තිබේ. මෙම මාසයේ 25 වැනිදා කුමන දවස ද?

1) සෙනසුරාදා 2) සිකුරාදා 3) සඳුදා

25. ළමයෙකු හා විවිධ බර සහිත තරාදි පඩි යෙදු තරාදියක් දැක්වෙන රූප සටහනක් පහත වේ. තරාදිය සමබර නම් ළමයාගේ බර කොපමණ දැයි තෝරන්න.




1) 50 kg

2) 46 kg

3) 44 kg

❖ සහල් ගෝනි 3 ක බර 100 kg කි. පළමු ගෝනියේ බර දෙවැනි ගෝනියට වඩා 5 kg ද තුන්වෙනි ගෝනියට වඩා 3 kg ද බර වැඩි ය.

26. පළවෙනි ගෝනියේ බර කොපමණ ද?

1) 36 kg 2) 31 kg 3) 33 kg

27. ඒ අනුව සහල් අඩුවෙන් ම ඇත්තේ කුමන ගෝනියේ ද?

1) පළවන ගෝනියේ 2) තුන්වන ගෝනියේ 3) දෙවන ගෝනියේ

28. පැය තුනකට වරක් නාදවන ඔරලෝසුවක් තිබේ. එය පෙ.ව. 7.00 ට නාද විය. ඊළඟ නාදවන අවස්ථා දෙක ඇතුළත් පිළිතුර තෝරන්න.

1) පෙ.ව.11.00 සහ ප.ව.1.00 2) පෙ.ව. 10,00 සහ ප.ව. 2.00

3) පෙ.ව.10.00 සහ ප.ව.1.00

29. සුපුන් පාලිතට වඩා උසය, කමලා අරුණිට වඩා මිටිය. මේ අනුව නිවැරදි ප්‍රකාශය වන්නේ,


1) පාලිතට වඩා කමලා උස ය.

2) සුපුන් අරුණිට වඩා උස ය.

3) මේ අයගේ වඩා උස කවුරුන්දැයි කීම අසීරුය ය.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

❖ පහත සටහන අනුව අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු තෝරන්න.




30. කමල් මායාගේ කවුද?

1) තාත්තා    2) බාප්පා    3) මාමා

31. සේනගේ මුණුබුරා කවුද?

1) චමල්    2) නිසල්    3) රුවන්

32. මාගේ වම් අත පැත්තෙන් කාව්‍යා ද, දකුණු අත පැත්තෙන් මීනා ද සිටී. ඒ අනුව මීනා ට වම් අත පැත්තෙන් ඇය ආසන්නයේ ම සිටින්නේ කවුරුන් ද?

1) මම    2) කාව්‍යා    3) කිසිවකු නොවේ.

❖ දිනිති හා මයුරි ළඟ ඇති මුදලේ එකතුව රු 270.00 කි, මයුරි හා තිලක් ළඟ ඇති මුදලේ එකතුව රු. 330.00 කි, දිනිති, මයුරි හා තිලක් යන තිදෙනා ළඟම ඇති මුදලේ එකතුව රු 450.00 කි,

33. දිනති සහ තිලක් යන දෙදෙනා ළඟ ඇති මුදල්වල එකතුව කීය ද?

1) රු. 280.00    2) රු. 300.00    2) රු. 350.00

34. ඒකාකාරී වේගයකින් ගමන් කරන බස් රථයකට 60 km ක දුරක් ගමන් කිරීමට මිනිත්තු 90 ක් ගත වේ. පැයක දී මෙම වාහනය ගමන් කරන දුර කොපමණ ද?


1) 30 km    2) 40 km    3) 32 km

35. ඇපල් ගෙඩි 1 ක් මිලදී ගත් සරත් වෙළෙන්දාට වර්ග දෙකකින් යුත් කාසි දෙක බැගින් දුන්නේය. ඇපල් ගෙඩියක මිල රුපියල් 14.00 කි.

1) රුපියල් 5 කාසි 2 යි, සත පනහේ කාසි 2 යි.
2) රුපියල් 2 කාසි 2 යි, රුපියලේ කාසි 2 යි.
3) රුපියල් 5 කාසි 2 යි, රුපියල් 2 කාසි 2 යි.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

36. මෙම යන්ත්‍රයට 50 සංඛ්‍යාව ඇතුළත් කාඩ්පතක් ඇතුළත් කළ විට ලැබෙන පිළිතුර වන්නේ.




1) 400

2) 100

3) 800

37. බෝතලයක නිල් පාට පෑන් 6 ක් හා රතු පාට පෑන් 8 ක්ද, කළු පාට පෑන් 9 ක්ද දමා ඇත. බෝතලය දෙස නොබලා රතු පාට පෑනක් නිවැරදි ව ම ලබා ගැනීමට පිටතට ගත යුතු අවම පෑන් ගණන කීය ද?

1) 15 2) 16 3) 17


38. 25 සහ 15 යන සංඛ්‍යා දෙකෙහි එකතුව එම සංඛ්‍යා දෙකේ වෙනස මෙන් කී ගුණයක් ද?

1) හතර ගුණයක් 2) පස් ගුණයක් 3) තුන් ගුණයක්

39. ප.ව.5.00 ට පමණ මා නිවසට එන විට මාගේ හෙවැණැල්ල මා පසු පස පැමිණියේ නම් මා කවර දිශාවක් ලබා ගමන් කරමින් සිටියේද? නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

1) බස්නාහිර දිශාවට 2) නැගෙනහිර දිශාවට 3) උතුරු දිශාවට

40. පහත පෙට්ටියේ පැති හයේම රූප ඇඳ ඇත. ඔබට පෙනෙන පැත්තට විරුද්ධ පැත්තේ ඇත්තේ ද එම රූපයමය. එම පෙට්ටිය දිග හැරිය විට දැක්වෙන නිවැරදි ආකාරය තෝරා එයට යටින් ඉරක් අඳින්න.



1) 2) 3)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# පුබුදින පස් පියුම් - 2024

## 5 ශ්‍රේණිය ශිෂ්‍ය සාධනය ඉහළ නැංවීමේ වැඩසටහන

## මහනුවර අධ්‍යාපන කලාපය

**II - පත්‍රය**

කාලය :- පැය 1 මිනිත්තු 15 යි.

විභාග අංකය -........................

**විභාගයට පෙනී සිටින ඔබට උපදෙස් -**

- ඔබේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
- තුන්වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේ ද ඔබේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 60ක් ඇත. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයන්න. (සමහර ප්‍රශ්නවල අනුකොටස් ද ඇත.)
- පිළිතුරු ලිවීමට දී ඇති ප්‍රශ්නවලට පිළිතුරු තිත් ඉර මත ලියන්න.
- පිළිතුරට යටින් ඉරක් අඳින්න කියා ඇති විට ඉරක් පමණක් අඳින්න.
- පිළිතුරු තුනක් දී ඇති ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

**උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණයි.**

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |
| 8 | |
| එකතුව | |

**අවසාන ලකුණු**

| | |
|---|---|
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| **පළමු පරීක්ෂක**<br>ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍ර ඇගයීම් කළ බව සහතික කරමි. | V/I/S |
| **දෙවන පරීක්ෂක**<br>පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි. | V/I/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක**<br>ඇගයීම් කර ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණු නිවැරදි බව තහවුරු කරමි. | V/I/S/EMF එකතුව |
| **ප්‍රධාන පරීක්ෂක**<br>අධීක්ෂණය කළෙමි. අවසාන ලකුණු නිවැරදි ය. | V/I/S/CH |

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

01) පහත දැක්වෙන ඡේදය කියවා අසන ලද ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

සෑම ගෙයක් ම ගෙවත්තකින් යුක්ත ය. අක්කරයක් දෙකක් තරම් විශාල ගෙවත්ත හතර වටේ ම පැළ ඉනි වැටකි. ගේ ඉදිරි පසින් වැටෙන් ඇතුළු වීමට සෑදූ කඩුල්ලකි.

ගෙවතු දෙහි, දොඩම් හා මඤ්ඤොක්කා යන වගාවන්ගෙන් යුක්ත ය. කෝං, මාදං, සියඹලා, බුරුත, වෑවරන, මිල්ල වැනි විශාල ගස් එකක් දෙකක් හෝ නැති ඉඩමක් දැකිය නොහැකි ය. මයිල ගසක් හෝ කිහිපයක් සෑම ඉඩමක ම වෙයි. කපා බිම හෙළන ලද විශාල ගස්වල කඳන් පිලිස්සී ඉතුරු වූ කොටස් මේ ඉඩම්වල සුලබ ය....

හැම ඉඩමක ම ලබු වැලක් දෙකක් අනිවාර්යයෙන් දකින්නට ලැබේ. දිය ගෙන ඒමට ගන්නා භාජනය වශයෙන් හා බීජ සඳහා ගන්නා ධාන්‍ය තැන්පත් කර තැබීමට ලබුකැට භාවිත වේ. මේ නිසා බින්තැන්නේ ජන ජීවිතයට ලබු වැල නැතුව ම බැරි දෙයකි.

වනගත චාරිකා, පියසේන කහඳගමගේ.

(i) ඉහත විස්තරයට අනුව ගෙවත්ත වටේට ඇත්තේ කුමක් ද? ..................................................

(ii) ගේ ඉදිරිපස වැටෙන් ඇතුළු වීමට සාදා ඇත්තේ කුමක් ද? ..................................................

(iii) ගෙවත්තේ ඇති විශාල ගස් වර්ග තුනක් ලියන්න. ..................................................

(iv) ගෙවත්තේ ඇති වගාවන් මොනවා ද? ..................................................

(v) මෙහි සඳහන් පරිදි ලබු වැලෙන් ඇති ප්‍රයෝජනයක් ලියන්න. ..................................................

(vi) ඡේදයෙන් සොයා සඤ්ඤක අක්ෂර සහිත වචනයක් ලියන්න. ..................................................

(vii) "සිව් පැත්ත ම" යන අදහස සඳහන් වන්නේ කෙසේද? ..................................................

02) පහත යුගළ පද සම්පූර්ණ කරන්න.

(i) යාන - ..............................

(ii) .............................. - දොර

03) ඉරි ඇඳි පදයට සමාන පදය වරහන් තුළින් තෝරා ඊට යටින් ඉරක් අඳින්න.

(i) <u>අවුරුද්ද</u> පුරා පිපෙන මල්වර්ග ඇත. (මසක්/ වසරක්)

(ii) වවුලා <u>රාත්‍රියෙහි</u> හැසිරෙන සතෙකි. (අඳුරෙහි/ රැයෙහි)

04) පහත වාක්‍ය ඒක වචනයට හරවා ලියන්න.

(i) මී මැස්සෝ ඉතා කඩිසර ලෙස හැසිරෙති.

..................................................

05) නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචනය තෝරා යටින් ඉරක් අඳින්න.

(I) මහපටෑඇගිල්ල (II) මහපටැගිල්ල (III) මහාපටගිල්ල

(I) ස්වෙච්ඡාවෙන් (II) ස්වෙච්චාවෙන් (III) ස්වෙඡ්ඡාවෙන්

06) මහාප්‍රාණ අක්ෂරය සහිත වචනය යටින් ඉරක් අඳින්න.

(I) සුළඟ (II) අධ්‍යාපනය (III) රඹුටන්

07) පහත අක්ෂර වල පිල්ලම වරහන තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.

(I) "ද" - (කෙටිවක් පාපිල්ල/ කෙටි කොන් පාපිල්ල/ ඉස්පිල්ල)

(I) "ඖ" - (ඉරුකාරය/ දීර්ඝය/ ගයනුකිත්ත)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

08) පහත පිරුළු වල අදහස ලියන්න.

(i) කටුස්සාගේ කරේ රත්තරන් බැන්දා වගේ

.................................................................................................

(ii) කළුවා මාරපන ගියා වගේ

.................................................................................................

09) විරාම ලක්ෂණ යොදන්න.

(i) ලිලී අම්මා ෆෙවත් වයලට් ආච්චි පාසලට පැමිණියේ අමුතු රාජකාරියටක ය

(ii) ඔක්සිජන් ටිකක් දීලා බලමු යි කව්දෝ කිව්වා

10) පහත සඳහන් වගන්ති ලිඛිත භාෂාවට හරවා වර්තමාන කාල ක්‍රියා පද යොදමින් නැවත ලියන්න.

(i) මම පාසල් යෑමට පෙර මල් කැඩුවා.

.................................................................................................

(ii) ලේන් පැටවා ගසෙන් බිමට වැටුණා.

.................................................................................................

11) පහත දී ඇති වචන නිවැරදිව ගළපා අර්ථවත් වැකියක් සාදා ලියන්න.

(i) සීනි බෝලයකි/ මුදලාලි/ ඉතුරු/ දුන්නේ/ සතේට

.................................................................................................

12) පහත වැකි වල උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය නිවැරදි නම් (✓) ලකුණද, වැරදි නම් (×) ලකුණද වරහන තුළ යොදන්න.

(i) ඔවුහු එවරස්ට් කන්ද තරණය කළේය. ( )

(ii) අත්තම්මා වැදගත් රාජකාරියක් කළේය. ( )

13) පහත වචන වල අරුත් පැහැදිලි කරන්න.

(i) අබිමුවට - .................................................................................


(ii) දෛනික -.................................................................................

14) ❋ පහත දැක්වෙන ඉංග්‍රීසි වචන වල සිංහල අදහස ලියන්න.

(i) Sea - ..................................... (ii) Eight .....................................

❋ පහත රූප වලට අයත් ඉංග්‍රීසි වචනය ලියන්න.

(i)



.....................................

(ii)



.....................................


Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

15) පහත දැක්වෙන දෙමළ වචන වල සිංහල අදහස ලියන්න.

(i) පච්චෛ නිරම් - ........................................

(ii) තිංගළ් කිළමෛ - ........................................

(iii) රූපය දෙස බලා එය දෙමළ බසින් පවසන ආකාරය ලියන්න.



........................................

තිත් ඉර මත පිළිතුර ලියන්න.

16) 45 602 සංඛ්‍යානාමය ලියන්න. ........................................


17) 9 075 සංඛ්‍යාව විහිදුවා ලියන්න. ........................................

18)

| | |
|---|---|
| 1 | 0 |
| 3 | 9 |

මෙම කොටුව තුළ ඇති සංඛ්‍යා යොදාගෙන සෑදිය හැකි කුඩාම සංඛ්‍යාවත් විශාලම සංඛ්‍යාවක් අතර වෙනස කීයද? ........................................

19) A සහ B ගණක රාමු දෙකේ ඇති සංඛ්‍යා වල එකතුව සොයා ලියන්න. ........................................




20) හිස් තැනට ගැළපෙන සංඛ්‍යා සොයා ලියන්න.

(i) 68, .................., 72, 74


(ii) 106, 110, .................., 118

21) පහත සංඛ්‍යා අවරෝහණ පිළිවෙලට සකසා ලියන්න.

| 668 | 358 | 907 | 1065 |
|---|---|---|---|

........................................

22) ඔරලෝසු මුහුණතේ දැක්වෙන වේලාවට පැයකට පෙර වේලාව ලියන්න.




........................................

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

23) උතුරු හා නැගෙනහිර දිශාව අතර පිහිටි දිශාවට විරුද්ධ දිශාව කුමක් ද? ..........................................




24) පහත ප්‍රස්තාරයේ දැක්වෙන්නේ පන්තියක ළමුන් පුස්තකාලයෙන් ලබාගත් පොත් පිළිබඳව තොරතුරකි.




1) පන්තියේ සිටින මුළු ළමුන් සංඛ්‍යාව කීය ද? ..........................................

2) නවකතා පොත් සහ රචනා පොත් අතර වෙනස කීය ද? ..........................................

25) අයියා සහ මල්ලිගේ වයස් වල එකතුව අවුරුදු 20 කි. අයියා මල්ලිට වඩා අවුරුදු 4ක් වැඩිමල්ය. ඔවුන් දෙදෙනාගේ වයස සොයන්න.

(i) අයියාට වයස .......................................... (ii) මල්ලිට වයස ..........................................

26) බඳුනේ ඇති මල් ගණන රෝම සංඛ්‍යාවෙන් ලියන්න.




..........................................

27) ගෝනියක හාල් $15kg$ $175g$ ඇත. ඉන් $8kg$ $800g$ විකුණන ලදී. ඉතිරි වූ හාල් ප්‍රමාණය කොපමණ ද?

..........................................

28) පහත බඳුන් වලට අල්ලන ජල ප්‍රමාණයන් සොයන්න.




A → ..........................................

B → ..........................................

29) පහත බිල්පත සම්පූර්ණ කරන්න.

| ද්‍රව්‍ය | ප්‍රමාණය | ඒකක මිල | ගෙවිය යුතු මුදල |
|---|---|---|---|
| කඩල | $3Kg$ | .......................... | රු. 270.75 |
| | | | |
| බිස්කට් පැකට් | 5 | රු.215.00 | .......................... |

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

**දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා ඊට යටින් ඉරක් අඳින්න.**

30) සෞඛ්‍යවත්, කාර්යශූර්ය ජීවිතයක් සඳහා උපකාරී වන්නකි,

(i) අසනීප වූ වහාම රෝහල් ගත වීම.

(ii) මස් මාළු පමණක් ආහාර ගැනීම.

(iii) සූර්ය නමස්කාරයේ යෙදීම.

31) අධ්‍යාත්මික යෝග්‍යතාවය ලබාගත හැකිවේ

(i) සූර්ය නමස්කාරය

(ii) ක්‍රීඩා තරග

(iii) සිත් පහන් කිරීමේ ක්‍රියාකාරකම.

32) රාජ්‍ය ලාංඡනයේ තිබෙන වී කරල් වලින් නිරූපණය වන්නේ,

(i) ධර්මය

(ii) ස්වයං පෝෂිත බව හා සශ්‍රීකත්වය

(iii) සෞභාග්‍ය හා පරිපූර්ණ බව

33) කැරොල්ගී ගායන සංදර්ශන පවත්වනු ලබන්නේ,

(i) මුස්ලිම් ජාතිකයින් (ii) කතෝලික බැතිමතුන් (iii) ආධිවාසීන්

34) තම ප්‍රදේශයේ ඇති රාජ්‍ය ආයතනයකි,

(i) ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

(ii) පෞද්ගලික බැංකුව

(iii) සුපිරි වෙළඳසැල

35) කඳේ මල් හට ගන්නා ශාකයකි,

(i) නා ගස (ii) සල් ගස (iii) අරලිය ගස

36) භාණ්ඩ මිලදී ගැනීමේ දී සැලකිලිමත් විය යුතුම කරුණකි,

(i) කල් ඉකුත්වීමේ දිනය (ii) වෙළඳ නාමය (iii) දවටනයේ අලංකාර බව


37) ලේන්සුවක වාටිය මැසීමට ඉතා සුදුසු මැහුම් ක්‍රමයකි,

(i) දම්වැල් මැස්ම (ii) බිලැන්කට් මැස්ම (iii) නූල්දිවවීම

38) ක්ෂණික ආහාර, තෙල් මිරිස් අධික ආහාර ගැනී මනේ වැළදදේ

(i) අම්ල පිත්ත රෝගය (ii) දියවැඩියාව (iii) පාචනය

39) මෙම පරීක්ෂණයේ දැන ගත හැකි වන්නේ,



(i) රත්වීමේදී ජලය වාෂ්පවේ.

(ii) ජලයේ සංයුතිය

(iii) තාපය පිළිබඳව

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

40) ශ්‍රී ලංකාව බෙදා ඇති පළාත් ගණන වන්නේ,

(i) 7 කි (ii) 9 කි (iii) 24 කි

41) පොළවේ සිට අහසට චන්ද්‍රිකායානා යැවිය හැකි බව සොයා ගත්තේ,

(i) නීල් ආම්ස්ට්‍රෝන් (ii) යූරි ගගාරින් (iii) ආතර් සී. ක්ලාක්

42) ශ්‍රී ලංකාව අතීතයේ යටත්කර ගත් ආක්‍රමණිකයන් පිළිවෙලින්,

(i) ලන්දේසි, ඉංග්‍රීසි, පෘතුගීසි

(ii) පෘතුගීසි, ලන්දේසි, ඉංග්‍රීසි

(iii) ඉංග්‍රීසි, ලන්දේසි, පෘතුගීසි

43) පිදුරුතලාගල කන්ද පිහිටා ඇති දිස්ත්‍රික්කය වන්නේ,

(i) නුවරඑළිය (ii) බදුල්ල (iii) මාතලේ

44) බත්වල බහුලව අඩංගු පෝෂ්‍ය පදාර්ථය වන්නේ,

(i) ප්‍රෝටීන් (ii) විටමින් D (iii) කාබෝහයිඩ්‍රේට්

45) අතීතයේ වැඩ පහසුකර ගැනීමට සෙක්කුව භාවිත කළේ,

(i) වළං සෑදීමට (ii) තෙල්සිඳීම (iii) කුරහං ඇඹරීම

46) අඩුවෙන් ජලය පානය කිරීම නිසා දැනෙන අපහසුවක් නොවේ,

(i) සම වියළීම

(ii) සිරුරේ මලානික බව

(iii) මුත්‍රාවල වර්ණය ලා පැහැ වීම

47) අතීතයේ ආහාර කල්තබා ගැනීමට භාවිත කළ ක්‍රමයකි,

(i) ශීතකරණයේ තැබීම

(ii) ජෑම් සෑදීම

(iii) මී පැණිවල බහා තැබීම

48) බීම වර්ගවල ලේබලයේ රතු වර්ණය සහිත රවුමෙන් පෙන්නුම් කරන්නේ,

(i) සීනි මධ්‍යම ප්‍රමාණයට ඇති බව

(ii) සීනි අඩු ප්‍රමාණයකට ඇති බව

(iii) අධික සීනි සහිත බව

49) මුදුන් මුලක් රහිත ශාකයකි,

(i) කරපිංචා (ii) මිරිස් (iii) බඩ ඉරිඟු

50) "ගිරෙන් ගිරට පැන ලැගුම් සොයා ....." වන්නමෙන් කියවෙන සත්වයා,

(i) ගිරවා (ii) වඳුරා (iii) ඇතා

51) පහත මල් අතරින් පොකුරු කාණ්ඩයට අයත් මල් වර්ගයකි,

(i) සූරියකාන්ත (ii) ඇහැළ (iii) සේපාලිකා

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

52) ශ්‍රී ලංකාවේ ජාතික පුෂ්පය වන්නේ,

(i) නිල්මානෙල් (ii) නෙලුම් (iii) මානෙල්

53) ශාක භක්ෂක, මාංශ භක්ෂක, සර්ව භක්ෂක සත්ත්ව කාණ්ඩය,

(i) කපුටා, මුවා, කොටියා

(ii) කොටියා, කපුටා, මුවා

(iii) මුවා, කොටියා, කපුටා


54) අපට නොමිලයේ ලැබෙන සේවාවක් නොවේ,

(i) සෞඛ්‍යය (ii) අධ්‍යාපනය (iii) විදුලිය

55) වස්තුවක් ඉහළට ඇදීම පහසුකරයි,

(i) දැඩු අඬුව (ii) කප්පිය (iii) රෝදය

56) පහත රූප සටහනේ යකඩ ඇණය ක්‍රියාකරන්නේ,



(i) වියළි කෝෂයක් ලෙස

(ii) විද්‍යුත් චුම්බකයක් ලෙස

(iii) බඹරයක් ලෙස

57) මල් පරාගනයට උදවු වෙන කෘමි සතෙක් වන්නේ,

(i) මී මැස්සා (ii) වවුලා (iii) පැණි කුරුල්ලා

58) අපට සිදුවිය හැකි ස්වාභාවික අනතුරකි,

(i) විදුලි සැර වැදීම (ii) නාය යෑම (iii) ආහාර විෂ වීම

59) සිත් පහන් කිරීමේ ක්‍රියාකාරකමේ තුන්වන පියවර,

(i) අධිෂ්ඨානය (ii) ප්‍රාර්ථනාව (iii) උදානය

60) වැස්සට පෙර අහස කළු වලාකුළෙන් වැසී යයි. ගොරවා විදුලි කොටමින් වැසි වසියි. පොද වැස්සකින් ආරම්භ වන වැස්ස ක්‍රමයෙන් වැඩිවෙයි. "මහ වැස්සකට පසු" යන මාතෘකාව ඔස්සේ වැකකි තුනක් ලියන්න.

(උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය නිවැරදි විය යුතු ය. සෑම වාක්‍යකම වචන පහකට වඩා වැඩි විය යුතු ය.)

(1) ..............................................................................................................................

..............................................................................................................................

(2) ..............................................................................................................................

..............................................................................................................................

(3) ..............................................................................................................................

..............................................................................................................................

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# පුබුදින පස්පියුම් - II පත්‍රය පිළිතුරු

1) 1. පැළ ඉනි වැටක්
   2. කඩුල්ලකි
   3. කෝං / මාදං / සියඹලා / බුරුත / වැවර / මිල්ල (3 ක් පමණි)
   4. ගෙවතු දෙහි , දොඩම් , මඤ්ඤොක්කා
   5. දිය ගෙන ඒමට ගන්නා භාජන සදහා යොදාගැනීම / බීජ සදහා ගන්නා ධාන්‍ය තැන්පත්කර තැබීමට යොදා ගැනීම.
   6. සියඹලා
   7. හතර වටේම

2) 1. වාහන 2. ගේ

3) 1.වසර 2. රැයෙහි

4) මී මැස්සා ඉතා කඩිසර ලෙස හැසිරෙයි.

5) 1. මහපටැගිල්ල 2. ස්වේච්ඡාවෙන්

6) අධ්‍යාපනය

7) 1. කෙටි කොණ් පාපිල්ල 2. ගයනුකිත්ත

8) 1. නුසුදුස්සාට තනතුරු වරප්‍රසාද ලබාදීම.

   2. විමසීමකින් තොරව කටයුතු කිරීම.

9) 1. `ලිලී අම්මා' හෙවත් `වයල්ට් ආච්චි' පාසලට පැමිණියේ අමුතු රාජකාරියකටය.
   2. "ඔක්සිජන් ටිකක් දීලා බලමු," යි කව්දෝ කිව්වා.

10) 1. මම පාසල් යාමට පෙර මල් කඩමි.
    2. ලේන් පැටවා ගසෙන් බිමට වැටෙයි.

11) * මුදලාලි ඉතුරු සතේට දුන්නේ සීනි බෝලයකි.

12) 1. × 2. ×

13) 1. ඉදිරියට 2. දිනපතා සිදුකරන

14) 1. මුහුද 2. අට
    1. FLOWER / Flower 2. FRUIT / Fruit

15) 1. කොළ පාට 2. සදුදා දවස 3. පූනෙයි උල්ලෙයි

16) හතලිස් පන්දහස් හයසිය දෙක

17) 9 000 + 0 + 70 + 5

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

18) 8 271
19) 2 803
20) (i) 70 (ii) 114
21) 1065 , 907 , 668 , 358
22) වේලාව 9.05
23) නිරිතදිග
24) (i) 15 යි (ii) 1 යි
25) 1. අයියට අවුරුදු 12 යි 2. මල්ලිට අවුරුදු 8 යි
26) Vi
27) 6kg 375g
28) A – 250ml B – 500ml
29) 1. රු. 90.25 2. රු. 1075.00

| | | | |
|---|---|---|---|
| 30) | (III) | 45) | (II) |
| 31) | (III) | 46) | (III) |
| 32) | (II) | 47) | (III) |
| 33) | (II) | 48) | (III) |
| 34) | (I) | 49) | (III) |
| 35) | (II) | 50) | (II) |
| 36) | (I) | 51) | (I) |
| 37) | (II) | 52) | (III) |
| 38) | (I) | 53) | (III) |
| 39) | (I) | 54) | (III) |
| 40) | (II) | 55) | (II) |
| 41) | (III) | 56) | (II) |
| 42) | (II) | 57) | (I) |
| 43) | (I) | 58) | (II) |
| 44) | (III) | 59) | (I) |

60) අදාළ නිර්නායක අනුගමනය කරන්න.